SEC/PN/IT/2026/05
2026/09/22

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

මහජනතාව වෙත කරනු ලබන දැනුම්දීමයි

## නිශ්චිතව දක්වනු ලබන කාර්යයන් සඳහා TIN සහතිකය අනිවාර්යයෙන් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (සංශෝධිත) 102(3) වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද 2023 මැයි 31 දිනැති අංක 2334/21 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව, 2023 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ක් වන හෝ 18ට වැඩි සියලුම වාසික පුද්ගලයින් මෙන්ම 2024 ජනවාරි 01 දින හෝ එදිනට පසු වයස අවුරුදු 18ට එළඹෙන වාසික පුද්ගලයින් (එම වයසට එළඹීමෙන් අනතුරුව) බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් (Tax Identification Number – TIN) ලබා ගැනීම අනිවාර්ය වේ.

ඒ අනුව, TIN අංකයක් ලබාගැනීම සඳහා ලියාපදිංචි වන සෑම තැනැත්තෙකු සඳහා ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් TIN සහතිකයක් නිකුත් කරනු ලැබේ.

2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් හඳුන්වා දෙන ලද විධිවිධානවලට අනුකූලව දේශීය ආදායම් පනතේ 102(3) වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති සෑම තැනැත්තෙකුම **2026 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නිශ්චිතව දක්වා ඇති කාර්යයන් සිදු කිරීමේ දී වලංගු TIN සහතිකයක් ඉදිරිපත් කළ යුතු බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ.**

- යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක යම් ගිණුමක් විවෘත කිරීම
- ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමැතිය ලබා ගැනීම
- මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීම
- මෝටර් වාහන බලපත්‍රය අලුත් කිරීම
- ඉඩමක් හෝ ඉඩමක හිමිකම ලියාපදිංචි කිරීම
- ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම
- ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක කොටස් පැවරීම, පැවරුම්ලාභියකු සහ පැවරුම්කරුවකු විසින් සිදු කරනවිට
- ණය කාඩ්පතක් ලබා ගැනීම

ඉහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ සම්පූර්ණ කිරීමට පෙර, අදාළ තැනැත්තා විසින් වලංගු TIN සහතිකයක් ඉදිරිපත් කර තිබෙන බවට අදාළ වගකිව යුතු නිලධාරීන් විසින් තමන් වෙත නිකුත් කර ඇති චක්‍රලේඛය ප්‍රකාරව තහවුරු කර ගන්නා ලෙසට නියම කර ඇත.

**ඒ අනුව, ඉහත නිශ්චිතව දක්වා ඇති යම් කාර්යයක නිරත වීමට අදහස් කරනු ලබන සියලුම තැනැත්තන් වෙත පහත සඳහන් උපදෙස් නිකුත් කරනු ලැබේ.**

- ඔබ දැනටමත් TIN අංකයක් ලබා ගෙන නොමැති නම්, TIN අංකයක් ලබා ගන්න. ඒ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ - සේවාව හරහා ඉල්ලුම් කරන ලෙස ඔබට දැනුම් දෙනු ලැබේ (https://eservices.ird.gov.lk/Registration/TINRegistration/ShowRequestHeader).
- ඔබ සතුව වලංගු TIN සහතිකයක් තිබෙන බව තහවුරු කර ගන්න.
- නිශ්චිතව දක්වන ලද කාර්යයක් සඳහා TIN සහතිකය අවශ්‍ය වන විට, අදාළ ආයතනය හෝ නිලධාරියා වෙත TIN සහතිකයේ පිටපතක් ලබා දෙන්න.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ - සේවාව හරහා තමන්ගේ TIN අංකය තහවුරු කර ගැනීම සඳහා පුද්ගලයින්හට අවස්ථාව සලසා ඇත (https://eservices.ird.gov.lk/Registration/verifyirdinformation/index). තහවුරු කිරීම සාර්ථකව සිදු වූ පසු TIN අංකය තිරයේ දිස් වේ. අදාළ පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත් (NIC) අංකය සහ TIN අංකය පැහැදිලිව දැක්වෙන එහි මුද්‍රිත පිටපතක්ද ඉහත කාර්යයන් සඳහා නිල TIN සහතිකය වෙනුවට පිළිගනු ලැබිය හැකි ය.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

බදු - වඩා හොඳ අනාගතයකට